ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
GLOBAL SRILANKAN FORUM
SRI PANGNANANDA DHARMAYATHANAYA, RAILWAY STATION ROAD,
KELANIYA, SRI LANKA
REGISTRATION NO : GA3458 | TEL : +94 11 2 910146
WWW.GLOBALSRILANKANFORUM.ORG | INFO@GLOBALSRILANKANFORUM.ORG

10.03.2018

මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ, ශ්‍රී ලංකාව

**<u>පුද්ගලයින් අතුරුදන් කිරීමෙන් වැලකීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත බල රහිත කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමයි</u>**

ගරු ජනාධිපතිතුමනි,

ඔබතුමා දන්නා පරිදි 2018 මාර්තු 07 වන දින පුද්ගලයින් අතුරුදහන් කිරීමෙන් වැලකීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය පාර්ලිමේන්තුවේ සුලු බහුතරයකින් සම්මත කරන්නට යෙදුනි.

මේ පනත හදිසියේ සම්මත කරගැනීමට රජය උත්සුක වූයේ පසුගිය ජනවාරි මස 25 වන දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් සෙයිද් රාද් අල් හුසේන් මහතා විසින් නිකුත් කරන ලද A/HRC/37/23 දරණ වාර්තාවෙන් රජය තදබල ලෙස විවේචනය කර තිබීම නිසාවෙන් බව පැහැදිලිය.

ඔබතුමා දන්නා පරිදි මෙම ප්‍රඥප්තිය පැමිණවීමද, ජිනීවා මානව හිමිකම් සමුළුවේ 30 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව සම අනුග්‍රහයෙන් ඉදිරිපත් කර සම්මත කරගන්නා ලද 30/1 ගිවිසුම අනුව සිදුකරන ලද ක්‍රියාවකි.එම ගිවිසුම පිළිබඳ දැඩි විවේචනයක් රට තුල පවතින අතර එහි අඩංගු හුදු අභූත චෝදනා, අඩුම තරමේ "විශ්වාස කිරීම සඳහා සැලකීමට" වත් සුදුසු සාක්ෂි නොමැති හුදු ද්වේශයෙන් පිරුනු ප්‍රලාප බව ගෝලීය ශ්‍රී ලාංකික සංසදය විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට 2017 මාර්තු මස ඉදිරිපත් කරන ලද "විරුවන්ගේ විත්ති වාචකය" තුලින් ඔප්පු කරන ලදී.

මීට ප්‍රථමද අප ඔබ තුමාගෙන් මේ සාවද්‍ය චෝදනා එල්ලකර ඒවා ඔප්පු නොකරම දඬුවම් දෙන ක්‍රියාවලිය නවතා දැමීමට ඉදිරිපත් වන ලෙස ඉල්ලා සිටි අතර ඔබතුමාගේ දේශහිතෛෂී දේශානුරාගීභාවය ගැන අප විශ්වාසය තැබුවෙමු.

මීට ප්‍රථම අවස්ථා දෙකකදීම මෙම අනර්ථකාරී පනත පාර්ලිමේන්තුවේ විවාදයට භාජනයවීම වැලක්වීමට ඔබතුමා හට හැකිවුන අතර ඔබතුමා මහා සංඝරත්නයටද 2017 සැප්තැම්බර් 21 දින ඒ සඳහා ප්‍රතිඥා ලබා දෙන ලදී.

තත්ත්වය එසේ පැවතුනද, ඊයේ දිනයේදී (07.03.2018) සවස හදිසියේම එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සුළු චන්ද ප්‍රමාණයකින් සම්මත කරගන්නා ලදී.

මෙහි භයානක සහ පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූල නොවන තත්ත්වය වන්නේ ඊයේ උදය වරුවේදී කතානායකතුමා විසින් මෙම පනත විවාදයට නොගන්නා බවට ප්‍රකාශ කලත් , එය නොසලකා එම දිනයේදීම අපරභාගයේදී එම අදහස වෙනස් කර අධිකරණයේ පවා අනුමැතියට ලක් නොවූ ,රටේ රණවිරුවන්ට ඉතා හානිදායක ලෙස බලපාන්නා වූ පනතක් ඉතා අත්තනෝමතික ලෙස සම්මත කර ගැනීමයි.

මෙම පනත හුදු අපරාධකරුවන්ට දඬුවම් දෙන පනතක් නම් ඒ පිළිබඳව අප අවධානය යොමු නොකරනු ඇත.මෙය හුදු අපරාධකරුවන්ට දඬුවම් කිරීමට පමණක් බලය දෙන පනතක් නොව, හුදු අභූත චෝදනාවක් එල්ල කල පමණින් ඕනෑම රටකදී අත්අඩංගුවට ගැනීමට ඕනෑම රටකට නෛතික බලය පවරන පනතක්ද වේ.

පසුගිය පලාත් පාලන මැතිවරණයේදී ඔබතුමා පුන පුනා පවසා සිටියේ කිසිම ලෙසකින්වත් අපේ රණවිරුවන් පිටරට වලට භාර නොදෙන බවයි. නමුත් මෙම පනතින් සිදුව ඇත්තේ බාරදීමක් නොව පැහැරගෙන යාමට හෝ රඳවා ගැනීමට නෛතික බලයක් ජාත්‍යන්තර ප්‍රඥප්තිය අත්සන් කර ඇති ඕනෑම රටකට ලබා දීමයි.

එමනිසා අප ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ වහාම එම පනත බල රහිත කිරීමට කටයුතු කරන ලෙසයි.

මීට,

**විශ්වාසී,**

……………………..  
සුනිල් චන්ද්‍රකුමාර  
සභාපති  
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය

……………………………..  
යසස් ධර්මදාස  
ප්‍රධාන ලේකම්  
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය

පිටපත්:  
අති උතුම් පූජ්‍ය ත්‍රෛයිනිකායික මහා නායක හිමිවරුන්  
අති උතුම් කාදිනල්තුමා  
අති උතුම් හින්දු පූජකතුමා  
අති උතුම් මවුලවිතුමා  
ඒකාබද්ධ විපක්ෂය  
ජනතා විමුක්ති පෙරමුණ  
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ  
සියළුම ජනමාධ්‍ය ආයතන